# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර සඳහා බඳවා ගැනීම (අභ්‍යන්තර )

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත සඳහන් තනතුරු පුරප්පාඩුව ස්ථිර පදනම මත පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**(1) රැකියා විස්තරය**

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) සමස්ත මූල්‍ය කළමනාකරණය භාරව කටයුතු කිරීම.
2. මූල්‍ය සැලසුම්කරණය සිදු කිරීම සහ මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම.
3. මූල්‍ය පාලනයට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගී වීම.
4. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) කළමනාකාරිත්වයට මූල්‍ය හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් උපදේශන සහ මාර්ගෝපදේශ ලබා දීම.
5. ආයතනයේ මූල්‍ය සහ සම්පත් සැලසුම්කරණ කටයුතු සිදු කිරීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

ගිණුම්කරණය, මූල්‍ය හෝ මූල්‍ය ආර්ථික විද්‍යාව ක්ෂේත්‍රයේ 1 වන හෝ 2 වන පන්තියේ ගෞරව උපාධිය සහ පශ්චාත් උපාධිය සමඟ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්ද සහ එයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම .

හෝ

ගිණුම්කරණය, මූල්‍ය හෝ මූල්‍ය ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ 1 වන හෝ 2 වන පන්තියේ ගෞරව උපාධියක් සහ එම ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය සමඟ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්ද සහ එයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම .

හෝ

ගිණුම්කරණය, මූල්‍ය හෝ මූල්‍ය ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය සහ පශ්චාත් උපාධිය සහිත දීප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

හෝ

ගිණුම්කරණය, මූල්‍ය හෝ මූල්‍ය ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය සහ එම ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය සහිත දීප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

හෝ

ගිණුම්කරණය, මූල්‍ය හෝ මූල්‍ය ආර්ථික විද්‍යාව ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය සහ පශ්චාත් උපාධිය ලබා තිබීම සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස අවම වශයෙන් වසර 07ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

ගිණුම්කරණය, මූල්‍ය හෝ මූල්‍ය ආර්ථික විද්‍යාව ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය සහ එම ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය ලබා තිබීම සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස අවම වශයෙන් වසර 07ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

**(4) වැටුප් පරිමාණය :-** TRC 1.3 - රු. 262,752 (10x11,261) -(10x12,669) – 502,052

( මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට බලපැවැත්වේ) .

**(5) අයදුම් කිරීමේ ක්‍රමය**

අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික කළ පිටපත් සහ අංශ ප්‍රධානියාගේ නිර්දේශය සමඟ, අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයට පෙර පාලන හා ආයතනික කටයුතු අංශයට ඉදිරිපත් කළ යුතුය

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026. 08.05 වේ.

**(6) පොදු කොන්දේසි**

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පත්කිරීම් කාණ්ඩයේ VI වන පරිච්ඡේදයේ 77 වන වගන්තිය ප්‍රකාරව මෙම පත්වීම වසරක වැඩ බලන කාලයකට යටත් වේ.
2. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
3. අයදුම්පත් භාරගැනීම සඳහා නියම කර ඇති අවසන් දිනයට පෙර, ඉහත සඳහන් කර ඇති සියලුම අවශ්‍ය සුදුසුකම් අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබේ නම් පමණක්, ඔහු/ඇය මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලත් අයෙකු ලෙස සැලකේ.
4. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක. 276
ඇල්විටිගල මාවත
කොළඹ 08